සැ. යු.- (i) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2010 වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා වූ කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2011.12.31 දිනෙන් අවසන් වන වර්ෂයට අදාළ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්ගේ නාමාවලියක් පළ වේ.

(iii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2012.12.31 දිනෙන් අවසන් වන වර්ෂයට අදාළ ශ්‍රී ලංකාවේ විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන්ගේ නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,821 - 2013 ජූලි මස 26 වැනි සිකුරාදා - 2013.07.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1702 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1702 |

| | පිටුව |
|---|---|
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1708 |

සැ. යු.- (i) මර්කස් සකාෆතුල් ඉස්ලාමියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 ජුනි මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ර/කුරුවිට මධ්‍ය මහා විද්‍යාලයීය ආදී ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 ජුනි මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අගෝස්තු මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජූලි මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් පාලන නිවේදන

## මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාව

### මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභා මායිම තුල පිහිටි පහත සඳහන් සියලුම ප්‍රදේශයන් සංවර්ධනය වූ ප්‍රදේශයන් බවට ප්‍රකාශයට පත් කිරීම

වර්ෂ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා ව්‍යවස්ථා අංක 134 : 01 අනුව මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභා මායිම තුළ පිහිටා ඇති පහත දැක්වෙන වගුව තුළ සඳහන් කර ඇති ප්‍රදේශයන් සංවර්ධනය වූ ප්‍රදේශයන් බවට ප්‍රකාශ කිරීම සඳහා වර්ෂ 2012 ඔක්තෝබර් මස 26 වැනි දින පැවැත්වූ 58 වැනි සභා රැස්වීමේ දී සම්මත තීරණයක් බවට පිළිගැනින. මේ සම්බන්ධව 2013 මාර්තු මස 08 වැනි දින *ගැසට් පත්‍රයේ* පළ වූ මෙම දැන්වීම අහෝසි කර ඒ වෙනුවෙන් පළාත් පරිපාලන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්තුමා විසින් එය නැවත ප්‍රකාශයට පත් කරන බවට ප්‍රකාශ කර සිටියි.

| *ප්‍රදේශය : ගම්* | | *ග්‍රාමසේවක කොට්ඨාසය* | *ග්‍රාම සේවක කොට්ඨාස අංකය* |
|---|---|---|---|
| කොක්කට්ටිවච් චෝලෙයි | 1. | කොක්කට්ටිච් චෝලෙයි | 134 |
| | 2. | කොක්කට්ටිච් චෝලෙයි දකුණ | 134 ඒ |
| මහිලඩිත්තීවු | 1. | මහිලඩිත්තීවු | 129 |
| | 2. | මහිලඩිත්තීවු දකුණ | 129 බී |
| මුදලෙයික්කුඩා | 1. | මුදලෙයික්කුඩා | 131 |
| | 2. | මුදලෙයික්කුඩා දකුණ | 131 ඒ |
| මුනෙයික්කාඩු | 1. | මුනෙයික්කාඩු නැගෙනහිර | 133 |
| | 2. | මුනෙයික්කාඩු නිරිත | 133 ඒ |
| | 3. | මුනෙයික්කාඩු දකුණ | 133 බී |
| | 4. | මුනෙයික්කාඩු උතුර | 133 සී |
| අරසඩිත්තීවු | 1. | අරසඩිත්තීවු | 128 |
| | 2. | අරසඩිත්තීවු උතුර | 128 සී |
| කඩුක්කාමුනෙයි | | කඩුක්කාමුනෙයි | 128 ඒ |
| පට්ටිප්පලෙයි | | පට්ටිප්පලෙයි | 128 බී |
| අම්බලාන්තුරෙයි | 1. | අම්බලාන්තුරෙයි | 127 |
| | 2. | අම්බලාන්තුරෙයි | 127 ඒ |
| | 3. | අම්බලාන්තුරෙයි | 127 බී |
| බණ්ඩාරියාවෙලි | | බණ්ඩාරියාවෙලි | 129 |

පළාත් පාලන දෙපාර්තමේන්තුව,

සහකාර කොමසාරිස්,
මඩකලපුව.

07-704

---

# අතුරු ව්‍යවස්ථා

## සොරණාතොට ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වැනි වගන්තිය /126 වැනි වගන්තියේ (VII) වැනි උපවගන්තියේ (ඌ) ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල යටතේ සොරණාතොට ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා, 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඌව පළාතේ,

පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පලකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථා සොරණාතොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මකවන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශෂීන්ද්‍ර රාජපක්ෂ,
පළාත් පාලන විෂයය භාර අමාත්‍ය සහ ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය,
ඌව පළාත් සභාව.

2013 ජූනි මස 02 වැනි දින,
බදුල්ල,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**රථ වාහන නවතා තැබීම, පාලනය කිරීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු 126VII(ඌ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව සොරණාතොට ප්‍රාදේශීය සභාව විසින් මෝටර් වාහන නතර කිරීම, පාලනය කිරීම හා විධිමත් කිරීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව මෙයින් පනවනු ලැබේ.

01. මෙම අතුරු ව්‍යවස්ථාව සොරණාතොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ "මෝටර් වාහන නතර කිරීම, පාලනය කිරීම හා විධිමත් කිරීම" පිළිබඳව අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

02. සොරණාතොට ප්‍රාදේශීය සභා (මින් මතු සභාව යනුවෙන් හැඳින්වෙන) බල ප්‍රදේශය තුළ කිසියම් වීථියක් හෝ වීථියක කොටසක් හෝ වාහන නතර කිරීම, නැතහොත් නතර කර තැබීම තහනම් කරන, සීමා කරන හෝ පාලනය කරන, එසේ නැතහොත් වාහන සඳහා වෙන් කරනු ලැබේ. ඇති කිසියම් වාහන නතර කර තබන ස්ථානයක් දක්වන දැන්වීමක් සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයාගේ නියමය ප්‍රකාරව හෝ ඒ වීථියෙහි නැතහොත් වීථියේ කොටසෙහි ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

එහෙත් පහත දක්වා ඇති අවස්ථාවල දී මෙම වගන්තියේ අදාළ සීමාවන් බල නොපැවැත්විය යුතු ය :-

(අ) කිසියම් නිලධරයෙකු හෝ බලධරයෙකු විසින් එම වීථියේ හෝ වීථියේ කොටසෙහි ඉදිකරනු ලැබ හෝ ප්‍රදර්ශනනය කරනු ලැබ ඇති කිසියම් වාහන සංඥාවකට හෝ දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීම.
(ආ) ඒ වීථියේ හෝ වීථියේ කොටසෙහි ඒ අවස්ථාවේ පවත්නා කිසියම් වාහන ගමනාගමනයක පිළිවෙල නිසි පරිදි අනුගමනය කිරීම.
(ඇ) කිසියම් තැනැත්තෙකුට එම වාහනයෙන් බැසීමට හෝ එම වාහනයට ගොඩවීමට ඉඩ දීම.
(ඈ) එම වාහනයට බඩු පැටවීමේ හෝ ඒ වාහනයෙන් බඩු බෑමේ හෝ කාර්යය සඳහා අවශ්‍ය කාලයකට හැර, එම වාහනය එම වීථියේ හෝ වීථියේ කොටසෙහි නතර කර තැබීමට සැලැස්වීම කරනු නොලැබිය යුතුය.

03. සභා බල ප්‍රදේශය තුළ 01 වැනි උපලේඛනයේ දැක්වෙන මෝටර් වාහනයක් පොදු වාහන නවතා තැබීමේ ස්ථානයක හෝ කුලී රථ ගාලක නියමිත ගාස්තු ගෙවීමකින් තොරව නවතා තැබීම නොකළ යුතු වන්නේ ය.

04. පොදු වාහන නතරකර තබන ස්ථානයක හෝ කුලී රථ ගාලක කිසියම් තැනැත්තෙකු විසින් මෝටර් වාහනයක් එම වාහනයේ අයිතිකරු හෝ රියදුරු අත හෝ වාහනයේ පෙනන තැනක අලවා හෝ සභාව විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් ඇත්නම් මිස නතර කර තැබීම නොකළ යුතු වන්නේ ය.

05. පොදු වාහන නතර කර තබන ස්ථාන තීරණය කිරීම, එම ස්ථානය වෙනස් කිරීම, එම ස්ථාන අවලංගු කිරීම හා සීමාවන් තීරණය කිරීම සභාව විසින් වරින් වර පනවනු ලබන යෝජනා සම්මුතියක් මගින් සිදු කරනු ලැබිය හැකිය.

06. කුලී ගමනක් සඳහා යොදවා ඇති ත්‍රීරෝද රථ සඳහා ත්‍රීරෝද රථ ගාල් ඇති කිරීම, වෙනස් කිරීම හා අවලංගු කිරීම සීමාවන් තීරණය කිරීම. සභාව විසින් වරින් වර පනවනු ලබන යෝජනා සම්මුතියක් මගින් සිදු කළ හැකිය. 02 උපලේඛනයේ සඳහන් ස්ථාන දැනට ත්‍රීරෝද රථ ගාල් ලෙස නම් කොට ඇත.

(අ) ත්‍රීරෝද රථ ගාලක් සඳහා ඇතුළත්වීමේ දී එක් වාහනයක් සඳහා එක් වරක් පමණක් ගෙවිය යුතු වූ රු. 200 ක ගාස්තුවක් සභාව වෙත ගෙවා අදාළ වාහනය සභාවේ ලියාපදිංචි කළ යුතු ය.
(ආ) අයදුම්කරු සභා බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙක් යන්න තහවුරු කළ යුතු ය.
(ඇ) අනුමැතිය ලැබීමෙන් පසු අයදුම්කරු සභාව සමග ගිවිසුමකට ඇතුළත් විය යුතු ය. අදාළ ගිවිසුම් අංක 07 උපලේඛනයෙන් දැක්වේ.

07. පොදු වාහන නතර කර තැබීමේ ස්ථානවල වාහන නතර කර තැබීම වෙනුවෙන් වූ ගාස්තු 03 උපලේඛනයේ ද, කුලී ත්‍රිරෝද රථ ගාල්වල නවතා තැබීම වෙනුවෙන් වූ මාසික ගාස්තු 04 උපලේඛනයේ ද සඳහන්වේ. මෙම ගාස්තු ප්‍රමාණයන් සභාව විසින් වරින් වර කරනු ලබන යෝජනා සම්මුති මගින් සංශෝධනය කළ හැක.

08. දුංහිඳ නැරඹීමට එන සංචාරකයින්ගේ වාහන නවතා තැබීම සඳහා පොදු වාහන නැවතුම්පලක් ලෙස මැඩිතලේ ගල්වල අසළ සිට දුංහිඳ ඇල්ලට පිවිසෙන ස්ථානයෙන් පහළ තිබෙන වංගුව දක්වා භූමි භාගය නම් කොට ඇති අතර, ඒ සඳහා වූ නවතා තැබීමේ ගාස්තු 05 උපලේඛනයේ සඳහන්වේ.

(අ) මෙකී ගාස්තු සංශෝධනයන් වරින්වර කරනු ලබන සභා යෝජනා සම්මුති මගින් සිදුකල හැකිය.
(ආ) වාහන නතර කර තැබීමේ සීමා තීරණය කිරීම සභාපතිවරයාගේ හෝ ලේකම්වරයාගේ තීරණ මත සිදු කල හැකිය.
(ඇ) කාලීන අවශ්‍යතා මත යම් යම් තීරණ ගැනීම්, සභා යෝජනා සම්මුති මගින් සිදුකල හැකිය.

09. පොදු වාහන නතර කරන ස්ථානවල මෝටර් වාහනයක් හැර අනෙකුත් වාහනයක් ඇතුල්වීම හෝ නවතා තැබීම කිසිවෙකු විසින් සිදු නොකල යුතු ය.

10. කුලී ත්‍රිරෝද රථ ගාලක සභාවේ ලියාපදිංචි ත්‍රිරෝද රථ හැර අන්‍ය වාහනයක් ඇතුල්වීම හෝ නවතා තැබීම කිසිවෙකු විසින් සිදු නොකළ යුතු ය.

11. අවස්ථානුකූලව සීමිත කාලයක් සඳහා ත්‍රිරෝද රථ ගාල් පිහිටුවීම, පොදු වාහන නවතා තැබීම, ස්ථාන නම් කිරීම හා ඒවා ඉවත් කිරීම සභා යෝජනා සම්මුති මගින් වරින්වර සිදු කල හැකිය.

12. (අ) ඒ ඒ මෝටර් වාහනය සඳහා නිකුත් කරනු ලබන අවසර පත්‍රය සඳහා මෙහි මතු සඳහන් උපලේඛනවලින් වාහනයට අදාල නියමිත ගාස්තුව *ගැසට් පත්‍රයේ* පල කිරීමෙන් අනතුරුව අය කරනු ලැබිය යුතු ය.

(ආ) ගාස්තු ගෙවීමෙන් පසු නිකුත් කරන ලද සෑම අවසර පත්‍රයකම එම අවසර පත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් ද, ඒ මෝටර් වාහනයේ හඳුනා ගැනීමේ අංකය ඇතුලත් විය යුතු අතර, අවසර පත්‍රයේ සඳහන් කාල සීමාව සඳහා පමණක් එය වලංගු විය යුතු ය.

(ඇ) පොදු වාහන නවතා තැබීමේ ස්ථානවල නවතා තබන වාහනවලින් ගාස්තු අයකිරීම සහ අවසර පත්‍ර නිකුත් කිරීම සභාව විසින් බලය පවරා පත් කරනු ලබන වාහන පාලකවරයෙකු විසින් සිදු කරනු ලැබිය යුතු ය.

13. පොලිස් නිලධාරියෙකු විසින් හෝ මෙම කාර්යයන් සඳහා සභාවේ සභාපති හෝ ලේකම් විසින් බලය පවරන ලද අයෙකු විසින් ප්‍රසිද්ධ වාහන නවතා තැබීමේ ස්ථානයක හෝ කුලී රථ ගාලක නවතා ඇති වාහනයක් සම්බන්ධයෙන් නිකුත් කර ඇති අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස එකී වාහනයේ රියදුරාගෙන් හෝ අයිතිකරුගෙන් ඉල්ලා සිටියහොත් ඔවුන් වෙත අවසර පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

14. කිසියම් නිශ්චිත වාහනයකට අයත් හෝ හැඳින්වීමක් ඇති මෝටර් වාහන සඳහා ප්‍රසිද්ධ වාහන නවතා තැබීමේ ස්ථානයක් වෙන් කර ඇති අවස්ථාවේ දී මෙකී සණයට හෝ හැඳින්වීමට අයත් නොවන මෝටර් වාහන කිසිවෙකු විසින් එකී ස්ථානයේ නවතා තැබීම නොකල යුතු ය.

15. පොදු වාහන නතර කිරීමේ ස්ථානයකට හෝ කුලී රථ ගාලකට වාහනයක් ඇතුල් කිරීමට හෝ වාහනයක් පිටතට ගැනීම අවහිර වන පරිදි කිසිවෙකු විසින් වාහන නවතා තැබීම නොකල යුතු ය.

16. පොදු වාහන නවතා තැබීමේ ස්ථානයක හෝ කුලී රථ ගාලක නවතා ඇති වාහනයක් කිසිවෙකු විසින් සේදීම හෝ වෙනත් අයෙකු ලවා සේදීමට සැලැස්වීම නොකල යුතු ය.

17. (අ) පොදු වාහන නවතා තැබීමේ ස්ථානයේ හෝ කුලී රථ ගාලේ නවතා ඇති වාහනයක් එකී ස්ථානයෙන් ඉවත් කර ගැනීම සඳහා පමණක් අළුත්වැඩියා කර ගැනීම අත්‍යවශ්‍ය වන්නේ නම් මිස එකී ස්ථානවල නවතා ඇති වාහනයක් කිසියම් අළුත්වැඩියාවක් කිසිවෙකු නොකල යුතු ය.

(ආ) උක්ත ප්‍රකාර අළුත්වැඩියාවක් කිරීමට සිදුවුවහොත් අවස්ථාවට අනුචිත ශබ්දයක් කිසිවකු විසින් නොකළ යුතුය.

18. (අ) යම් තැනැත්තකු පොදු වාහන නවතා තැබීමේ ස්ථානයක හෝ කුලී රථ ගාලක සිට බීමත්ව අනිසි ලෙස හා අශෝභන ලෙස හැසිරීම හෝ අන් අය හට හිරිහැරයක් වන ලෙස හැසිරීම නොකල යුතු ය.

(ආ) වාහනය තුල ඇති ශබ්ද විකාශන යන්ත්‍ර හා කැසට් යන්ත්‍ර, ගුවන් විදුලි යන්ත්‍ර හෝ වෙනත් හඬ පිට කිරීමේ යන්ත්‍රවල ශබ්දය වාහනය ඇතුලත සිටින අයට පමණක් ඇසෙන සේ පාවිච්චි කල යුතු වන අතර, ඒවායින් නැගෙන ශබ්දවලින් අන් අයට හිරිහැරයක් නොවිය යුතු ය.

19. රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ පුද්ගල මණ්ඩලයක් හෝ පුද්ගලයකු විසින් 06 උපලේඛනයේ සඳහන් මාසික ගාස්තුවක් ගෙවා අවස්ථාවෝචිත පරිදි දෙපාර්තමේන්තුවට හෝ' පුද්ගල මණ්ඩලයට හෝ පුද්ගලයාට අයිති මෝටර් රථය සඳහා මාසික අවසර පත්‍රයක් ලබාගෙන සභාපති විසින් අවසරය ලබාදෙන ස්ථානයක වාහනය නවතා තැබීම සිදුකල හැකිය.

20. ඉහත කරුණුවලට අමතරව සොරණාතොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කිනම් වීථියක හෝ පාරක හෝ අතුරු මාර්ගයක හෝ තාවකාලිකව නතර කර තබන මෝටර් වාහනවලින් බලයලත් නිලධාරියෙකු හෝ වාහන පාලකවරයෙකු/වරියකු විසින් අවසර පත්‍රයක් නිකුත් කොට උපලේඛන අංක 03 හි සඳහන් ගාස්තුව අයකල හැකිය.

21. *(අ)* එක් එක් දවසේ පෙ.ව. 6.00 සිට ප.ව. 7.00 දක්වා මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක විය යුතු ය.

*(ආ)* මෙම අතුරු ව්‍යවස්ථාව සතියේ කවර හෝ දවසක ක්‍රියාත්මක වීම නතර විය යුතු බවට රජයේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයකින් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකිය.

22. මෙම අතුරු ව්‍යවස්ථාවල උපලේඛනයේ සඳහන් ගාස්තු කිසියම් නිශ්චිත තැනැත්තෙකු හෝ තැනැත්තන් පංතියක් සභාව මගින් නියම කරන ලද පරිදි සභාපති හෝ ලේකම් විසින් කරන ලද නියමයක් මගින් නිදහස් කළ හැකිය.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණය මගින් වරදකරු කිරීමෙන් අනතුරුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියේ සඳහන් දණ්ඩනයන්ට යටත් වන්නේය.

24. මෙම අතුරු ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළ වූ දින සිට ක්‍රියාත්මක වේ.

25. මෙම අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පිටපත්වල යම් නොගැලපීමක් ඇති අවස්ථාවක සිංහල පිටපත බලපැවැත්වේ.

මෙම අතුරු ව්‍යවස්ථාවල අන්‍ය අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස "මෝටර් වාහනයක්" යනුවෙන් අදහස් කරන්නේ වාහනයක්, ත්‍රි රෝද රථයක්, බස් රථයක්, කැබ් රථයක්, ට්‍රැක්ටරයක්, ලොරියක්, ටිපර් රථයක්, යතුරු පැදියක්, ජීප් රථයක්, වෑන් රථයක්, වෙනත් යන්ත්‍රානුසාරයෙන් ගමන් කරනු ලබන (203 වැනි අධිකාරය) මෝටර් වාහන පනතේ ඊට දී ඇති අර්ථය දැක්වෙන වාහන යන්නයි. "සභාව" යන්නෙන් සොරණාතොට ප්‍රාදේශීය සභාව යන්න ද, සභාපති/ලේකම් යන්න සොරණාතොට ප්‍රාදේශීය සභාවේ සභාපති/ලේකම් ද, වාහන පාලක යන්නෙන් සභාපතිවරයා විසින් පත්කරනු ලබන තැනැත්තෙකු හෝ නිලධාරියෙකු අදහස් වන්නේය.

"පොලිස් නිලධාරියා" නිල ඇඳුමින් සැරසුණු පොලිස් නිලධාරියෙකු අදහස් වන්නේය.

"වාහන නතර කර තැබීම" යන්නෙන් මගීන් නැගීමට හෝ බැසීමට හෝ බඩු පැටවීමට හෝ බෑමට හෝ නතර කරනු ලබන වාහන හැර නියමිත ස්ථානයක නතර කර තබනු ලබන වාහන අදහස් වන්නේය.

සභාපති,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

**අංක 01 උපලේඛනය**

මෝටර් රථ වාහන වර්ගය :

01. ත්‍රිරෝද රථ.
02. කාර් හා වෑන්,
03. කුඩා හා ලොකු ලොරි,
04. ට්‍රේලර් සහිත හෝ රහිත ට්‍රැක්ටර්,
05. බස් රථ,
06. මෝටර් සයිකල් (යතුරු පැදි),
07. මෝටර් රථ හෝ මෝටර් කෝච්,
08. කැබ් රථ හා ජීප් රථ.

**අංක 02 උපලේඛනය**

*කුලී ත්‍රිරෝද රථ ගාල් පිහිටි ස්ථාන :*

01. කුට්ටියගොල්ල හන්දිය,
02. බෝලියද්ද ප්‍රජා ශාලාව අසල,
03. මහියංගන පාර 06 කණුව හන්දිය,
04. දූංහිඳ ප්‍රවේශ මාර්ගය ඉදිරිපිට (රථ ගාලේ දකුණුපස),
05. මහියංගන පාර අඹගහ ඔය (මීගහවෙල හන්දිය අසල),
06. මැඩිතලේ හන්දිය,
07. රිදීපාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට,
08. මහියංගන පාර ගුරුපුර හන්දිය,
09. සොරණාතොට පාලම අසල,
10. පිටපොල හන්දිය,
11. කන්දෙගෙදර හාලි ඇල පාරේ "නිල්මල් පොත" හන්දිය,
12. කන්දෙගෙදර හාලි ඇල පාරේ තැපැල් කාර්යාලය ඉදිරිපිට,
13. කන්දෙගෙදර කිරි ඕරුව පාර ආරම්භයේ,
14. කන්දෙගෙදර නාරංගල පාර ආරම්භයේ (දකුණුපස).

**අංක 03 උපලේඛනය**

*පොදු වාහන නතරකර තැබීමේ ස්ථානවල නතර කර තබන වාහන සඳහා ගාස්තු :*

| | පළමු පැය හෝ ඉන් කොටසක් සඳහා | සෑම අතිරේක පැයක් සඳහා හෝ ඉන් කොටසක් සඳහා හා එහෙත් පැය හතරකට නොවැඩි | අතිරේක සෑම පැයක් සඳහා හෝ ඉන් කොටසකට එහෙත් පැය හතරකට වැඩි |
|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත |
| (අ) යතුරු පැදියක් සඳහා, | 10 0 | 5 0 | 2 0 |
| (ආ) ත්‍රී රෝද රථයක් සඳහා, | 15 0 | 10 0 | 2 0 |
| (ඇ) මෝටර් කාරයකට හෝ මෝටර් රිය පෙට්ටියක් සඳහා, | 20 0 | 10 0 | 5 0 |
| (ඈ) බස් රථයක් හෝ ලොරි රථයක් සඳහා, | 30 0 | 20 0 | 10 0 |
| (ඉ) වෙනත් මෝටර් වාහනයක් සඳහා. | 20 0 | 10 0 | 5 0 |

**අංක 04 උපලේඛනය**

*කුලී ත්‍රීරෝද රථ සඳහා ගාස්තු :*

(අ) මසකට රු. 150ක ගාස්තුවක් අයකරනු ලබන අතර වර්ෂයේම මුදල් එකවර ගෙවීමේ දී 10% වට්ටමක් හිමිවේ.

**අංක 05 උපලේඛනය**

*දුංහිඳ දියඇල්ල ප්‍රවේශ මාර්ගය ඉදිරිපිට කලාපය :*

| | පළමු පැය 03 හෝ ඉන් කොටසක් සඳහා | පළමු පැය 03ට වැඩි පැය හතරක් නොඉක්මවන සෑම අතිරේක පැයක් හෝ ඉන් කොටසක් සඳහා | අතිරේක පැය හතර ඉක්මවන සෑම පැයක් සඳහාම |
|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත |
| (අ) යතුරු පැදියක් සඳහා, | 20 0 | 10 0 | 5 0 |
| (ආ) ත්‍රී රෝද රථයක් සඳහා, | 40 0 | 20 0 | 10 0 |
| (ඇ) මෝටර් කාරයකට හෝ මෝටර් රිය පෙට්ටියක් සඳහා, | 50 0 | 20 0 | 10 0 |
| (ඈ) බස් රථයක් හෝ ලොරි රථයක් සඳහා, | 70 0 | 30 0 | 20 0 |
| (ඉ) වෙනත් මෝටර් වාහනයක් සඳහා. | 40 0 | 20 0 | 10 0 |

**අංක 06 උපලේඛනය**

*මාසික අවසරපත්‍ර ගාස්තු :*

| | රු. ශත |
|---|---|
| (අ) ත්‍රී රෝද රථයක් සඳහා, | 200 0 |
| (ආ) මෝටර් කාරයක්/කැබ් රථයක්/ ජීප් රථයක්/ලොරි රථයක්/වෑන් රථයක්, | 300 0 |
| (ඇ) බස් රථයක් සඳහා, | 500 0 |
| (ඈ) ලොරි රථයක් සඳහා, | 400 0 |
| (ඉ) ට්‍රැක්ටරයක් ට්‍රේලරය සමග, | 350 0 |
| (ඊ) වෙනත් මෝටර් වාහනයක්. | 400 0 |

ඉහත ගාස්තු වර්ෂයටම අදාල වන සේ එකවර ගෙවීමෙන් 10%ක වට්ටමක් හිමිවේ.

අංක 07 උපලේඛනය

*කුලී රථ ගාලක නවතා සේවා සැලසීම සඳහා වූ ගිවිසුම් පත*

| | |
|---|---|
| වාහන පංතිය :- | |
| වාහන අංකය :- | |
| රථ ගාලේ අංකය :- | |
| සභාවේ ලියාපදිංචි අංකය :- | |

........................................................................................................................................ හි පංදිංචි ........................................................................
........................................................................................................................................................................................... යන අය
අංක ............................................................ දරන ............................................................. පිහිටි කුලී රථ ගාලේ දෛනිකව නවතා තබමින් කුලී රථයයක් ලෙසින් සේවා සැලසීම සඳහා සොරණාතොට ප්‍රාදේශීය සභාවේ සභාපති (සභාපති යන්නෙන් සොරණාතොට ප්‍රාදේශීය සභාවේ වර්තමාන සභාපතිවරයා හෝ ඔහුගේ ඇවැමෙන් එම බලතල ලබා ගන්නා හෝ පත් කරන්නා අදහස්වේ.) වෙත අයදුම්කර ඇති බවත්, ප්‍රාදේශීය සභා පනතේ සහ ඒ යටතේ සම්මත කරන ලද අතුරු ව්‍යවස්ථා යටතේ ඉහත කී සභාපතිවරයා විසින් ඉහත සඳහන් කුලී රථ ගාලේ නවතා තබමින් සේවා සැලසීමට මෙම ගිවිසුම අත්සන් කරන දිනයේ සිට පහත සඳහන් කොන්දේසිවලට හා නියමයන්ට යටත්ව ඉහත කී ගිවිසුම්කරුට මෙයින් අවසර දෙනු ලැබේ.

01. I. ඉහත කී රථ ගාලේ නවතා සේවා සැලසීම සඳහා වූ මාසික ගාස්තුව රු. ......................................... කි. එය සෑම මසකම 10 වැනි දිනට පෙර ගෙවිය යුතු ය. නියමිත දිනට පසුව ගෙවනු ලබන සෑම මාසික ගාස්තුවකට ම 20%ක ප්‍රමාද ගාස්තුවක් ගෙවිය යුතු ය.

II. මෙම රථ ගාලේ නවතා සේවා සැලසිය හැක්කේ, ලියාපදිංචි ගිවිසුම්කරුට හෝ ඔහුගේ වාහනයට පත් කර ඇති රියදුරුට පමණි. මෙහි වෙනත් කිසිවෙකු සේවය කිරීම නොකළ යුතු ය.

III. සභාවේ ලියාපදිංචි කරනු ලබන වාහනයක් සඳහා අනිවාර්යෙන්ම වලංගු මෝටර් රථ බලපත්‍රය සහ රක්ෂණ සහතිකය තිබිය යුතු ය.

IV. මෙම රථ ගාලේ නවතා ඇති වාහන, ඕනෑම අවස්ථාවක කිසිම වන්දියකින් තොරව ඉවත් කිරීමට සභාවේ සභාපතිවරයාට බලය ඇත්තේය. එවැනි අවස්ථාවක කිසිදු වන්දියක් ඉල්ලා සිටීමට හෝ වෙනත් සහනයක් ඉල්ලා සිටීමට අයිතිවාසිකමක් නැත්තේ ය.

V. මෙම රථ ගාලේ නවතා සේවා සැලසීම පෙ.ව. ................................ සිට ප.ව. ............................. දක්වා කල හැකිය. මින් පසු කිසිදු පුද්ගලයෙකු එම ස්ථානයේ නවාතැන්ගෙන සිටිය නොහැක.

VI. වාහනය නතර කර තිබෙන ස්ථානය, ප්‍රමාණය, එම වාහනයට සුදුසු ප්‍රමාණයක් විය යුතු අතර, එයට වැඩි ඉඩකඩක් අහුරා තබා ගැනීම කිසිසේත් නොකළ යුතු ය.

VII. වාහනය තුළ ශබ්ද විකාශන යන්ත්‍ර, කැසට්, රේඩියෝ හෝ වෙනත් ශබ්ද ජනිත වන උපකරණයක් මහජනයා හා අසල ගොඩනැගිලිවල පදිංචිකරුවන් හට පීඩා කාරී වන අන්දමින් ක්‍රියාත්මක නොකළ යුතු ය.

VIII. රථ ගාලේ තමන්ට නියමිත කොටස හෝ ඉන් කොටසක් වෙනත් අයෙකුට පැවරීම බදු දීම නොකළ යුතු ය. යම් අවස්ථාවක ගිවිසුම්කරු එසේ කරනු ලැබුවහොත්, එම වරද මත ගිවිසුම්කරුත් ඔහු විසින් අලුතින් යෙදවූ අයත් වාහනත් එම ස්ථානයෙන් නෙරපා හැරීමට සභාපතිවරයාට බලය ඇත්තේ ය.

IX. ස්වභාවික පරිසර බලපෑමක්, පොදු ජල කැළඹීමක් හෝ බාහිර පුද්ගලයකු මගින් හෝ තම වාහනය නතර කර තබන විට සිදුවන යම් හානියක් සඳහා ගෙවීමක් ලබා දෙන ලෙසට සොරණාතොට ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලා සිටීමට කිසිදු ගිවිසුම්කරුවකුට අයිතියක් නොමැත.

X. ගිවිසුම්කරු විසින් මේ සම්බන්ධයෙන් කලින් කලට සභාව විසින් පනවනු ලබන රෙගුලාසි හා නීතිරීතිවලට අවනතව කටයුතු කල යුතු ය.

XI. ගිවිසුම්කරු විසින් ඉහත සඳහන් කරන ලද ඕනෑම කොන්දේසියක් කඩ කරනු ලැබුවහොත්, ඔහු හෝ ඔහුගේ රියදුරු එම කුලී රථ ගාලෙන් නෙරපා දැමීමටත්, ප්‍රාදේශීය සභා අතුරු ව්‍යවස්ථා යටතේ නීතිමය පියවර ගැනීමටත්, සභාපතිවරයාට බලය ඇත.

02. ඉහත කොන්දේසිවලට අමතරව ප්‍රාදේශීය සභා කුලී රථ ගාලක සේවා සැලසීමට අවසර ලබාගත් ඕනෑම තැනැත්තෙකු පහත සඳහන් උපදෙස් හා නියමයන් තරයේ පිළිපැදිය යුතු ය.

*(අ) කුලී රථ ගාල්වලින් වාහන ඉවත් කිරීමට ඇති බලතල :*

I. වාහනය ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කර නොතිබීම.
II. මාසික අවසර පත්‍ර ගාස්තු නොකඩවා මාස තුනක් ගෙවීම් පැහැර හැර තිබීම.
III. සභාවේ ලියාපදිංචි කල වාහනය වෙනුවට එම ගිවිසුම්කරුට/රියදුරුට එම වාහනය වෙනුවට වෙනත් වාහනයක් සභාවේ ලියාපදිංචි නොකර නියමිත කුලී රථ ගාල තිබිය දී වෙනත් කුලී රථ ගාලකට ඇතුලත් කර (නවතා තබමින්) සේවා සැලසීම.

IV. සභා ගිවිසුමේ කොන්දේසි එකක් හෝ කිහිපයක් උල්ලංඝණය කිරීම.

V. අදාල රථ ගාල පිහිටි මාර්ගය හෝ ස්ථානය වෙනත් සංවර්ධන කටයුත්තකට හෝ විශේෂිත වූ අවශ්‍යතාවයක් සඳහා නිදහස් කර ගැනීමට අවශ්‍ය වූ විට සභාපතිවරයාගේ/සභා ලේකම්වරයාගේ නියමයෙන්,

*(ආ)* කුළී රථ ගාලකට අලුතින් ඇතුලත් කිරීම.

I. සභාවේ ලියාපදිංචි කර තිබීම.
II. ඉල්ලුම්කරු ගාස්තු නොගෙවා පැහැර හැර ඇති බවට හා පෙර වැරදි නොමැති බවට සභාව සෑහීමකට පත්වීම.
III. ලියාපදිචි කිරීමට අදාල කුළී රථ ගාලේ වාහනයක් අලුතින් ඇතුලත් කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ ඇති බවද සභාපතිවරයා සෑහීමකට පත්වීම.

*(ඇ)* කුළී රථ ගාලක ලියාපදිංචි වාහනයක් විකුණනු ලැබූ අවස්ථාවක -

I. වාහනය විකුණා දින 07ක් ඇතුලත ඒ බැව් ලිඛිතව සභාවට දැන්විය යුතුය.
II. විකිණීමෙන් අනතුරුව එම ගිවිසුම්කරුට වෙනත් වාහනයක් එම රථ ගාලට යෙදවීමට බලාපොරොත්තු වන්නේ නම් සේවා කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම නව රථය සභාවේ ලියාපදිංචි කිරීම හා අදාල මාසික අවසර පත්‍රය ලබාගැනීමට කටයුතු කල යුතුය.
III. වාහනය විකුණා තමන් නිදහස්ව සිටින කාලය සභාවට ලිඛිතව දැන්විය යුතුය. මෙම කාලය උපරිම මාස දෙකක් විය යුතුය. මාස දෙකකට වැඩි කාලයක් වන්නේ නම් එම වාහනය වෙනුවට පොරොත්තු ලේඛනය අනුව තවත් අයෙකුට අවස්ථාව ලබා දීමට සභාපතිවරයාට බලය ඇත.

මෙම සියලු කොන්දේසි හා නියමයන්ට එකඟ වෙමින් ගිවිසුම්කරු විසින් වර්ෂ ............................................... ක් වූ ........................... මස ................. දින මෙම ගිවිසුමට අත්සන් තබන ලදී.

...............................................
ගිවිසුම්කරු.

සභාපති,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

සාක්ෂි :-

| | නම | ලිපිනය | අත්සන |
|---|---|---|---|
| *01.* | ........................................... | ..................................................... | .................................................. |
| *02.* | ........................................... | ..................................................... | .................................................. |

07-693

---

# විවිධ දැන්වීම්

## සංශෝධනයයි

**බේරුවල නගර සභාව**

අංක 1-058-IV (ආ) කොටස ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය -1998.12.11

ඉහත ගැසට් නිවේදනයේ දෙවැනි උපලේඛනය (11 වැනි අතුරු ව්‍යවස්ථාව) 2013 වර්ෂයේ සිට පහත සඳහන් පරිදි සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙමි.

**දෙවැනි උපලේඛනය (11 වැනි අතුරු ව්‍යවස්ථාව)**
***වාර්ෂික අවසර පත්‍ර සඳහා ගාස්තුව***

| | | *රු. ශ.* |
|---|---|---|
| *(අ)* | ලොරියක් සඳහා | 500 0 |
| *(ආ)* | ටැක්සි රථවලින් හා වෙනත් මෝටර් රථයක් සඳහා | 350 0 |
| *(ඇ)* | රෝද තුනේ ටැක්සි (ත්‍රීවීල් රථවලින්) | 2,000 0 |

මිල්පර් කපූර්,
සභාපති,
බේරුවල නගර සභාව.

07-783

## කාත්තාන්කුඩිය නගර සභාව

නොසෙල්වෙන වස්තූන් වෙළඳාම සඳහා වූ බදු අයකිරීම

255 වැනි පරිච්ඡේදය වන නගර සභා ආඥාපනත 165 ඒ ඡේදය යටතේ කාත්තාන්කුඩිය නගර සභාවේ පරිපාලන සීමාව තුළ කුමක් හෝ නොසෙල්වෙන වස්තූන් වෙන්දේසිකරුවන් විසින් හෝ ඔවුන්ගේ සේවකයන් විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියකින් නැතිනම් වෙනත් ක්‍රමයකින් විකිණීමට යෙදුනහොත් එම විකුණුම්කරු විසින් එම වස්තූන් විකුණනු ලැබූ වටිනාකමෙන් 01%ක් කාත්තාන්කුඩිය නගර සභාවේ බදු වශයෙන් ගෙවිය යුතුයි.

එස්. එච්. එම්. අස්පර්,
සභාපති,
නගර සභාව,
කාත්තාන්කුඩිය.

07-797/4

---

## කාත්තාකන්කුඩිය නගර සභාව

අවසරපත් ගාස්තු හා තීරු බදු පැනවීම - 2013 වර්ෂය

2012.11.29 වැනි දින 2012/99 වන අංකය සහිත තීරණය පරිදි 2013.01.01 වැනි දින සිට පහත සඳහන් පරිදි ගාස්තු අය කර ගන්නා බව මෙයින් දන්වා සිටිමි. නගර සභා ආඥානීතිය 162 වන ඡේදයේ නගර සභාවට බදු හා අවසරපත් ගාස්තු අයකිරීම් සඳහා පවරා ඇති බලය යටතේ එම ආඥානීතිය 164 (1) ඡේදය මගින් සභාව විසින් පිරිනමා ඇති අවසරපත් සඳහා වූ ගාස්තු හා 165(අ) කොටසේ ඇති පරිදි නගර සභා සීමාව තුළ පවත්වාගෙන යන අත්කර්මාන්ත සඳහා බදුද 165(ආ) කොටසේ ඇති පරිදි නගර සභා සීමාව තුළ පවත්වාගෙන යන ව්‍යාපාර සඳහා ව්‍යාපාර බදුද පනවා 2013 වර්ෂය සඳහා අය කිරීමට මෙම නගර සභාව විසින් තීරණය කර ඇත. ඒ අනුව 2013.01.31 වැනි දිනට ප්‍රථම අවසරපත් ලබා ගත යුතු අත්කර්මාන්ත සඳහා ගාස්තු ගෙවා අවසරපත් ලබා ගන්නා ලෙසද අනෙකුත් කර්මාන්ත හා ව්‍යාපාරයන් සඳහා 2013.01.31 වැනි දිනට ප්‍රථම අදාළ බදු ගෙවිය යුතු බවද මෙයින් දන්වා සිටිමි. අදාළ කාල සීමාව තුළ අවසරපත් ලබා ගැනීමට හා බදු ගෙවීම අතපසු කලහොත් එයට විරුද්ධව අංක 10609 වන 1953 වර්ෂයේ නොවැම්බර් මස 06 වැනි දිනැති *ගැසට්* නිවේදනයේ නිකුත් කර ඇති පළාත් පාලන කාර්යාලය විසින් අනුමත කාර්යයන් පරිදි නගර සභා ආඥා නීතිය යටතේ 165(අ) (4) හා 165 (ආ) (3) පරිදි ශ්‍රේෂ්ඨාධිකරණය වෙත භාර දීමට කටයුතු සලසන ලෙස දන්වා සිටිමි. ලේඛන (1) (2) (3) හි සඳහන් නගර සභාවට ගෙවිය යුතු අවසරපත් සඳහා වූ ගාස්තු හා බදු ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

### අවසරපත් සඳහා වූ ගාස්තු

නගර සභා ආඥානීතිය 164 (1) කොටසේ ඇති පරිදි කාත්තාත්කුඩිය නගර සභා ප්‍රදේශය තුළ කුමක් හෝ ස්ථානයක් හෝ මධ්‍යස්ථානයක් අත්කර්මාන්ත හෝ ව්‍යාපාරයන් සඳහා උපයෝගී කර ගන්නේ නම් ඒ සඳහා අවසරපත් නැතිනම් අවසරපත් ගාස්තු ගෙවිය යුතුයි එම අවසරපත් 1956 වර්ෂයේ 06 වැනි අංකය දරන පළාත් පාලන කාර්යාලය විසින් අනුමත කාලීන නීතියන්ට අනුව අමාත්‍ය විසින් සකස් කරන ලද අංක 10609 වන 1953 වර්ෂයේ නොවැම්බර් මස 06 වැනි දිනැති *ගැසට්* නිවේදනයේ නිකුත් කර ඇති නගර සභා කාලීන නීතියන් මෙම නගර සභාව විසින් පිළිගෙන

2002.01.04 වැනි දින කොටස (iv) (ආ) අංක 11219 දරන *ගැසට්* නිවේදනයේ නිකුත් කර ඇති ආඥා පරිදි පහත දක්වා ඇති අත්කර්මාන්ත හා ව්‍යාපාර පවත්වාගෙන යාමයි. එමෙන්ම එවැනි ස්ථානයන්හි හෝටල් භෝජනාගාර නවාතැන් පහසුකම් සැපයුම් ස්ථාන යනාදියන්හි 2012 වර්ෂය සඳහා වූ ආදායමෙන් 01% වශයෙන් අවසරපත් සඳහා අය වන අතර අත්කර්මාන්ත හා ව්‍යාපාර සඳහා වාර්ෂික වටිනාකමින් පහත සඳහන් පරිදි ගාස්තු අය කරනු ලැබේ. තවද 01 වන ලේඛනයේ සඳහන් ව්‍යාපාර යහපත් ද අයහපත්ද යන්න තීරණය කරනුයේ නගර සභාවයි.

| *අංකය* | *වෙළඳ හෝ ව්‍යාපාර පිළිබඳ විස්තර* | *වාර්ෂික ගාස්තු වෙළඳ හෝ ව්‍යාපාර පවත්වාගෙන යන සම්පතේ වාර්ෂික වටිනාකම* | | | | |
|---|---|---|---|---|---|---|
| | | *රුපියල් 1,000ට නොවැඩි ස්ථාන සඳහා* | *රුපියල් 1,001 සිට 3,000 දක්වා වූ ස්ථානයට* | *රුපියල් 3,001සිට සිට 5,000 අතර වූ ස්ථානයට* | *රුපියල් 5,001 සිට සිට 10,000 අතරවූ ස්ථානයට* | *රුපියල් 10,000 ට නොවැඩි ස්ථානයට* |
| 01. | තේ කඩයක් පවත්වාගෙන යාම | 750 0 | 1,200 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 |
| 02. | කෑම කඩයක් පවත්වාගෙන යාම | 750 0 | 1,000 0 | 1,500 0 | 1,750 0 | 2,000 0 |
| 03. | ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 650 0 | 750 0 | 850 0 | 1,000 0 |
| 04. | පාන් පෝරනුවක් පවත්වාගෙන යාම | 1,000 0 | 1,500 0 | 1,750 0 | 1,850 0 | 2,000 0 |
| 05. | උත්සවයන් සඳහා කෑම සැපයීම (කේටරිං සර්විස්) | 750 0 | 900 0 | 1,000 0 | 1,200 0 | 2,500 0 |
| 06. | නවාතැන් පහසුකම් සැපයීම | 1,000 0 | 1,500 0 | 1,650 0 | 1.750 0 | 2,500 0 |
| 07. | හිසකෙස් සැකසීම හා අලංකාර කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 1,500 0 |

| අංකය | වෙළඳ හෝ ව්‍යාපාර පිළිබඳ විස්තර | වාර්ෂික ගාස්තු වෙළඳ හෝ ව්‍යාපාර පවත්වාගෙන යන සම්පතේ වාර්ෂික වටිනාකම | | | | |
|---|---|---|---|---|---|---|
| | | රරුපියල් 1,000 නොවැඩි ස්ථාන සඳහා | රුපියල් 1,001 සිට 3,000 දක්වා වූ ස්ථානයට | රුපියල් 3,001සිට සිට 5,000 අතර වූ ස්ථානයට | රුපියල් 5,001 සිට සිට 10,000 අතරවූ ස්ථානයට | රුපියල් 10,000 ට නොවැඩි ස්ථානයට |
| 08. | විදුලි බේකරියක් පැවැත්වීම | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 09. | පේමන්ට් වෙළඳාම | 500 0 | 600 0 | 700 0 | 800 0 | 1,000 0 |
| 10. | වර්ණ කලාව, අලංකාර කලාව | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 11. | අයිස්ක්‍රීම් අයිස් පැකට් නිෂ්පාදනය | 600 0 | 750 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 12. | සිසිල්බීම වෙළඳාම් ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 | 800 0 | 1,500 0 |
| 13. | එළකිරි වෙළඳාම | 500 0 | 600 0 | 700 0 | 800 0 | 1,500 0 |
| 14. | රසායනික පොහොර හා බීජ විකිණීම | 500 0 | 600 0 | 700 0 | 800 0 | 1,500 0 |
| 15. | ඉස්සන් හා මාළු වර්ග රැස් කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 16. | පරිසරය දූෂිත කරන අත්කර්මාන්ත | 500 0 | 600 0 | 700 0 | 800 0 | 1,500 0 |
| 17. | යන්ත්‍ර මගින් සේදීමේ කාර්මාන්තයක් පැවැත්වීම | 750 0 | 850 0 | 950 0 | 1,500 0 | 2,000 0 |
| 18. | හෝටල් | 750 0 | 850 0 | 950 0 | 1,500 0 | 2,000 0 |
| 19. | ශීත කරන ලද ආහාර වර්ග ගබඩා කිරීම | 750 0 | 850 0 | 950 0 | 1,500 0 | 2,000 0 |
| 20. | කුඩා සේදීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 650 0 | 750 0 | 850 0 | 1,000 0 |

*අත් කර්මාන්ත බදු :*

නගර සභා ආඥා නීතිය 165(අ) 165(ආ) (2) වන ඡේදය යටතේ මෙම නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන අත් කර්මාන්ත සඳහා ද එමඅත් කර්මාන්ත කරන ස්ථානයේ වාර්ෂික වටිනාකම මස 2013 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි 2013 වර්ෂයට බදු අයනරනු ලබන බව දන්වා සිටිමි.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 01. | කුඩා අත් කර්මාන්ත භාණ්ඩ | 500 0 | 750 0 | 850 0 | 950 0 | 1,000 0 |
| 02. | තකරම් භාණ්ඩ නිපැයුම් කිරීම | 500 0 | 750 0 | 850 0 | 900 0 | 1,000 0 |
| 03. | යකඩ තැලීමේ කම්හලක් | 500 0 | 750 0 | 850 0 | 950 0 | 1,000 0 |
| 04. | පාවහන් නිෂ්පාදනය | 500 0 | 750 0 | 850 0 | 950 0 | 1,000 0 |
| 05. | එක් පංගුකාරයෙක් හෝ ඊට වැඩි අය සමග ආභරණ වැඩපොලක් සඳහා | 1,000 0 | 2,000 0 | 3,000 0 | 4,000 0 | 5,000 0 |
| 06. | වඩු වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 |
| 07. | වැඩ දමන ලද ගල් හා බ්ලොක් ගල් නිෂ්පාදනය | 750 0 | 1,000 0 | 1,200 0 | 1,500 0 | 2,000 0 |
| 09. | යකඩ හා ලී වලින් භාණ්ඩ නිෂ්පාදනය | 750 0 | 1,000 0 | 1,250 0 | 2,000 0 | 2,500 0 |
| 10. | තනි පුද්ගලයෙකු සතු ආභරණ වැඩ පොලක් | 750 0 | 850 0 | 950 0 | 100 0 | 1,500 0 |
| 11. | හාල් මෝලක් පැවැත්වීම | 1,000 0 | 2,000 0 | 3,000 0 | 4,000 0 | 5,000 0 |
| 12. | පරණ ප්ලාස්ටික් භාණ්ඩ නැවත සකස් කිරීම | 1,000 0 | 2,000 0 | 3,000 0 | 4,000 0 | 5,000 0 |
| 13. | පැණි රස කෑම නිෂ්පාදනය | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 14. | යකඩ සිදුරුකිරීමේ වැඩ හා වෙනත් | 500 0 | 750 0 | 850 0 | 1,000 0 | 2,500 0 |
| 15. | මෝටර් රථ සේවිස් කිරීමේ ස්ථානයක් | 750 0 | 850 0 | 950 0 | 1,000 0 | 2,500 0 |
| 16. | විදුලි හෝ ගෑස් සම්බන්ධ වැඩ හා වෙනත් | 750 0 | 850 0 | 1,000 0 | 1,200 0 | 2,500 0 |
| 17. | ජංගම අයිස්ක්‍රීම් ව්‍යාපාරය | 500 0 | 600 0 | 700 0 | 800 0 | 1,500 0 |
| 18. | ස්ප්‍රේ තීන්ත ගෑම හා වෙනත් | 500 0 | 750 0 | 850 0 | 1,000 0 | 3,000 0 |
| 19. | යන්ත්‍ර මගින් ලී කැපීමේ වළක් තබා ගැනීම | 1,500 0 | 2,500 0 | 3,500 0 | 4,500 0 | 5,000 0 |
| 20. | මිරිස් හා කුළු බඩු ඇඹරීමේ ඇඹරුම්හලක් පැවැත්වීම | 1,000 0 | 2,000 0 | 3,000 0 | 4,000 0 | 5,000 0 |
| 21. | සත්ත්ව පාලනය (හරක් එළුවන් කුකුලන් ඇති කිරීම) | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 22. | හම් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 600 0 | 700 0 | 800 0 | 1,500 0 |
| 23. | යකඩ වැඩ පොලක් | 500 0 | 600 0 | 700 0 | 800 0 | 1,500 0 |

*වෙළෙඳ දැන්වීම්*

නගර සභා ආඥාපනතිය 165(අ) ඡේදය යටතේ මෙම නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන වෙළෙඳ ව්‍යාපාර සම්බන්ධයෙන් 2012 වර්ෂයේ වාර්ෂික ආදායමට අනුව පහත සඳහන් පරිදි 2013 වර්ෂයට බදු අයකරනු ලැබේ.

| *අංකය* | *වෙළෙඳාම හෝ ව්‍යාපාර පිළිබඳ විස්තර* | *පසු ගිය වර්ෂයේ වෙළඳාමෙන් වාර්ෂික ආදායම* | | | | |
|---|---|---|---|---|---|---|
| | | *රුපියල් 600 සිට රු.1,200 දක්වා* | *රුපියල් 1,200 සිට රු.18,750 දක්වා* | *රුපියල් 18,750 සිට රු.75,000 දක්වා* | *රුපියල් 75,000 සිට රු.1,50,000 දක්වා* | *රුපියල් 1,50,000ට ඉහල* |
| 01. | මසා නිම කරන ලද ඇඳුම් සමග රෙදි කඩයක් තිබීම | 2,000 0 | 2,500 0 | 3,500 0 | 4,500 0 | 5,000 0 |
| 02. | මසා නිම කරන ලද ඇඳුම් විකිණීමේ ආයතනයක් | 1,000 0 | 1,200 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 03. | මැහුම් ආයතනයක් | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 04. | රන් ආභරණ කඩයක් පැවැත්වීම | 1,500 0 | 2,000 0 | 3,000 0 | 4,000 0 | 5,000 0 |
| 05. | පිටි නැතිනම් සීනි තොග වෙළඳ ස්ථානය | 2,000 0 | 2,500 0 | 3,000 0 | 3,500 0 | 4,000 0 |
| 06. | මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානය | 2,000 0 | 2,500 0 | 3,000 0 | 3,500 0 | 4,000 0 |
| 07. | පාපැදි අමතර කොටස් | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 08. | පාපැදි අලෙවි මධ්‍යස්ථානය | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 09. | කුෂන් ගෘහ භාණ්ඩ අලෙවි ස්ථානය | 1,000 0 | 2,000 0 | 3,000 0 | 4,000 0 | 5,000 0 |
| 10. | රූපවාහිනී අලෙවි ස්ථානය | 1,000 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 11. | රූපවාහිනී අමතර කොටස් අලෙවි ස්ථානය | 750 0 | 850 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 12. | ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානය | 500 0 | 650 0 | 750 0 | 850 0 | 3,000 0 |
| 13. | මැටි භාජන අලෙවි ස්ථානයක් හෝ ගබඩා කිරීමේ ස්ථානය | 500 0 | 550 0 | 600 0 | 650 0 | 3,000 0 |
| 14. | ඡායා පිටපත් කිරීමේ ස්ථානය | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 15. | වී හෝ හාල් රැස්කිරීමේ හෝ ගබඩා කිරීම | 750 0 | 1,000 0 | 2,000 0 | 3,000 0 | 4,000 0 |
| 16. | මාළු ඇල්ලීමේ උපකරණ විකුණුම් මධ්‍යස්ථාන | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 17. | ඇලුමිනියම් උපකරණ අලෙවි හෝ රැස්කිරීම | 750 0 | 950 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 18. | සිල්වර් උපකරණ අලෙවිය | 750 0 | 950 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 19. | ඇස් කණ්නාඩි අලුත්වැඩියා කිරීම හෝ අලෙවි ස්ථානය | 750 0 | 950 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 20. | පුටු හා මේස කුලියට දීම | 750 0 | 950 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 21. | සැරසිලි භාණ්ඩ විකුණුම් ස්ථානය | 750 0 | 950 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 22. | මහන යන්ත්‍ර අලෙවි ස්ථානය | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 | 3,000 0 |
| 23. | බිත්තර අලෙවි ස්ථානය | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 24. | සෙල්ලම් බඩු අලෙවි ස්ථානය | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 25. | බිස්කට් වර්ග අලෙවි හා ගබඩා කිරීමේ ස්ථාන | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 | 3,000 0 |
| 26. | කිරිපිටි පැකැට්ටු අලෙවි හා ගබඩා කිරීම | 1,000 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 | 3,000 0 |
| 27. | පාපැදි අමතර කොටස් අලෙවිය | 750 0 | 950 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 28. | පරණ රන් භාණ්ඩ මිලදී ගැනීමේ ස්ථානය | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 29. | ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ අලෙවිය | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 | 3,000 0 |
| 30. | පරිඝණක පුහුණු පංති | 750 0 | 950 0 | 1,000 0 | 1,200 0 | 3,000 0 |
| 31. | පරිඝණනක අලෙවි ස්ථානය | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 32. | පරිඝණක අලුත් වැඩියා ස්ථානය | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 33. | පරිඝණක අමතර කොටස් අලෙවිය | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 34. | මොබයිල් දුරකථන අමතර කොටස් අලෙවිය | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 35. | මොබයිල් දුරකථන අලෙවිය හා අලුත්වැඩියාව | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 36. | මාබල් භාණ්ඩ විකිණීම | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 | 3,000 0 |
| 37. | ඡායා රූප සේදීමේ ස්ථානය | 500 0 | 750 0 | 850 0 | 950 0 | 3,000 0 |
| 38. | අලෙවි නියෝජිත | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 5,000 0 |
| 39. | පැදුරු පෙට්ටි අලෙවිය | 500 0 | 600 0 | 700 0 | 850 0 | 3,000 0 |
| 40. | ගොඩනැගිලි ද්‍රව්‍ය කුලියටදීම | 500 0 | 750 0 | 1,000 0 | 1,500 0 | 3,000 0 |
| 41. | පැටවීමේ ව්‍යාපාරය | 1,000 0 | 1,200 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 42. | සුවඳ ද්‍රව්‍යයන් විකිණීම | 500 0 | 600 0 | 700 0 | 800 0 | 3,000 0 |
| 43. | බැංකු නඩත්තු කිරීම | 1,000 0 | 2,000 0 | 3,000 0 | 4,000 0 | 5,000 0 |
| 44. | ගොඩනැගිලි රූප ඇඳීම | 1,000 0 | 1,200 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 45. | ඩිජිටල් පින්තාරු | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |

| *අංකයඅංකය* | *වෙළෙඳාම හෝ ව්‍යාපාර පිළිබඳ විස්තර* | *පසු ගිය වර්ෂයේ වෙළඳාමෙන් වාර්ෂික ආදායම* | | | | |
|---|---|---|---|---|---|---|
| | | *රුපියල් 600 සිට 1,200 දක්වා* | *රුපියල් 1,200 සිට 18,750 දක්වා* | *රුපියල් 18,750 සිට 75,000 දක්වා* | *රුපියල් 75,000ට 150,000 දක්වා* | *රුපියල් 150,000ට ඉහල* |
| 46. | ඇලුමිනියම් කණ්නාඩි සහිත ගෘහභාණ්ඩ/වෙළඳ භාණ්ඩ ගෙන්වීම හා අලෙවිය | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 47. | සන්නිවේදන සම්බන්ධතා මධ්‍යස්ථාන | 500 0 | 600 0 | 700 0 | 800 0 | 3,000 0 |
| 48. | ඒජන්සි තැපැල් ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 | 1,200 0 | 3,000 0 |
| 49. | කුලුබඩු පැකට් කිරීම | 500 0 | 600 0 | 700 0 | 800 0 | 3,000 0 |
| 50. | ශාරීරික ව්‍යායාම ස්ථාන - උපකරණ සහිත | 500 0 | 750 0 | 1,000 0 | 1,200 0 | 3,000 0 |
| 51. | පුද්ගලික ළමා පාසැලක් පැවැත්වීම | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 52. | පුද්ගලික පාසලක් පැවැත්වීම (මුදල් අයකර) | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 53. | මුද්‍රවාගත් ද්‍රව්‍ය අලෙවිය | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 5,000 0 |
| 54. | වාෂ්ප වැසූ බීම අලෙවිය | 750 0 | 850 0 | 950 0 | 1,200 0 | 3,000 0 |
| 55. | ට්‍රැක්ටර් වාහන අලුත්වැඩියා කරන ස්ථානය | 1,000 0 | 1,500 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 56. | ආයුර්වේද බෙහෙත් අලෙවි ස්ථානය | 500 0 | 650 0 | 750 0 | 850 0 | 3,000 0 |
| 57. | මුහුදු ද්‍රව්‍ය පදම් කිරීම | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 58. | මුද්‍රණාගාරයක් පැවැත්වීම | 1,000 0 | 1,500 0 | 1,650 0 | 1,750 0 | 3,000 0 |
| 59. | මෝටර් රථ අලුත්වැඩියා පමණක් | 750 0 | 850 0 | 1,000 0 | 1,200 0 | 3,000 0 |
| 60. | මෝටර් සයිකල් අලුත්වැඩියා පමණක් | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 61. | ඩීසල් පොම්ප අලුත්වැඩියාව | 500 0 | 600 0 | 700 0 | 800 0 | 3,000 0 |
| 62. | වතුර පොම්ප කිරීමේ යන්ත්‍ර අලෙවිය | 750 0 | 850 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 63. | නවාතැන් පහසුකම් පවත්වාගෙන යාම | 1,000 0 | 1,500 0 | 1,650 0 | 1,750 0 | 3,000 0 |
| 64. | බර වාහන අලෙවිය | 2,000 0 | 3,000 0 | 4,000 0 | 4,500 0 | 5,000 0 |
| 65. | පුද්ගලික රෝහල් (බෙහෙත් ශාලා ඇතුලු) | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 66. | කුලු බඩු කඩය | 750 0 | 850 0 | 1,000 0 | 1,500 0 | 3,000 0 |
| 67. | මෝටර් රථ බැටරි අලෙවිය | 500 0 | 700 0 | 850 0 | 950 0 | 3,000 0 |
| 68. | මෝටර් විදුලි කම්බි නැවත හයි කිරීම | 750 0 | 850 0 | 1,000 0 | 1,200 0 | 3,000 0 |
| 69. | විදුලි බැටරි සඳහා විදුලි කාවැද්දමේ මධ්‍යස්ථාන | 750 0 | 850 0 | 1,000 0 | 1,200 0 | 3,000 0 |
| 70. | රබර් ටයර් ටියුබ් රැස්කිරීම හෝ අලෙවි කිරීම | 500 0 | 600 0 | 700 0 | 800 0 | 3,000 0 |
| 71. | පාපැදි අලුත්වැඩියා මධ්‍යස්ථාන | 500 0 | 600 0 | 700 0 | 800 0 | 3,000 0 |
| 72. | විදුලි භාණ්ඩ අලුත්වැඩියා මධ්‍යස්ථාන | 500 0 | 750 0 | 850 0 | 1,200 0 | 3,000 0 |
| 73. | ගෑස් සිලින්ඩර අලෙවි මධ්‍යස්ථාන | 500 0 | 750 0 | 1,000 0 | 1,500 0 | 5,000 0 |
| 74. | දත් බැඳීමේ මධ්‍යස්ථානයක් නඩත්තු කිරීම | 750 0 | 1,000 0 | 1,250 0 | 1,500 0 | 3,000 0 |
| 75. | පලතුරු කඩයක් පැවැත්වීම | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 76. | අබ ගබඩා කිරීම හෝ අලෙවිය | 500 0 | 600 0 | 750 0 | 850 0 | 3,000 0 |
| 77. | දරමඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 78. | ලී මඩුවක් පවත්වාගෙන යාම | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 5,000 0 |
| 79. | ශීතකරණය සමග කුලුබඩු කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 | 3,000 0 |
| 80. | ගෘහ භාණ්ඩ අලෙවිය හෝ ගබඩා කිරීම | 1,000 0 | 2,000 0 | 3,000 0 | 4,000 0 | 3,000 0 |
| 81. | සීට් වැඩ සඳහා කුෂන් කිරීමේ වැඩ කරන ස්ථානය | 500 0 | 750 0 | 850 0 | 950 0 | 3,000 0 |
| 82. | රබර් මුද්‍රා සකස් කිරීම | 500 0 | 650 0 | 750 0 | 950 0 | 3,000 0 |
| 83. | සිමෙන්ති වලින් නිෂ්පාදිත ද්‍රව්‍ය අලෙවිය | 750 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 84. | ත්‍රී රෝද රථ අලුත්වැඩියාව | 750 0 | 850 0 | 1,000 0 | 1,500 0 | 3,000 0 |
| 85. | උලු විකිණීම හෝ ගබඩා කිරීම | 750 0 | 950 0 | 1,000 0 | 1,500 0 | 3,000 0 |
| 86. | වහල සඳහා වූ තහඩු අලෙවිය | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 87. | ගඩොල් අලෙවිය හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 88. | හිස් ගෝනි අලෙවිය හෝ ගබඩා කිරීම | 500 0 | 600 0 | 700 0 | 800 0 | 3,000 0 |
| 89. | මනමාලියන් සැරසීම/විවාහ උත්සවයන් සඳහා අවශ්‍ය උපකරණ ලබාදී/මල් විකිණීම | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 90. | හුණු විකිණීම හෝ ගබඩා කිරීම | 500 0 | 600 0 | 700 0 | 800 0 | 3,000 0 |
| 91. | ඉරපු ලී විකිණීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 92. | කලුගල් විකිණීම නැතිනම් රැස් කර තබා ගැනීමේ ස්ථානයක් තබා ගැනීම | 750 0 | 950 0 | 1,200 0 | 1,500 0 | 3,000 0 |
| 93. | සිමෙන්ති ගබඩා කිරීම නැතිනම් විකිණීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම | 1,000 0 | 2,000 0 | 3,000 0 | 4,000 0 | 5,000 0 |
| 94. | යකඩ කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 | 4,000 0 | 5,000 0 |
| 95. | මිරිස් කුඩු අලෙවිය | 500 0 | 600 0 | 750 0 | 850 0 | 3,000 0 |
| 96. | බේකරි නිෂ්පාදනයන් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 | 1,250 0 | 3,000 0 |

| අංකය | වෙළෙඳාම හෝ ව්‍යාපාර පිළිබඳ විස්තර | පසුගිය වර්ෂයේ වෙළඳාමෙන් වාර්ෂික ආදායම | | | | |
|---|---|---|---|---|---|---|
| | | රුපියල් 600 සිට රු.1,200 දක්වා | රුපියල් 1,200 සිට රු.18,750 දක්වා | රුපියල් 18,750 සිට රු.75,000 දක්වා | රුපියල් 75,000 සිට රු.1,50,000 දක්වා | රුපියල් 1,50,000ට ඉහළ |
| 97. | ඛනිජ ද්‍රව්‍ය අලෙවි මධ්‍යස්ථානයක් පැවැත්වීම | 750 0 | 1,000 0 | 1,250 0 | 1,500 0 | 3,000 0 |
| 98. | කාර්යාලයක් පවත්වාගෙන යාම | 750 0 | 1,000 0 | 1,250 0 | 1,500 0 | 3,000 0 |
| 99. | ස්වභාවික නොවන මල් නූල් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 | 1,250 0 | 3,000 0 |
| 100. | ගුවන් බලපත්‍ර අලෙවි ස්ථානයක් | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 101. | ලැමිනේටිං හා ඡායා පිටපත් | 500 0 | 750 0 | 900 0 | 1,250 0 | 3,000 0 |
| 102. | ඡායාරූප ගැනීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 | 1,250 0 | 3,000 0 |
| 103. | නම සහිත ලෑලි සකස් කිරීම | 750 0 | 1,000 0 | 1,250 0 | 1,500 0 | 3,000 0 |
| 104. | පත්තර ව්‍යාපාරය හා විකිණීම් නියෝජිත මධ්‍යස්ථාන | 500 0 | 750 0 | 1,000 0 | 1,250 0 | 3,000 0 |
| 105. | පත්තර හා කඩදාසි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 | 1,250 0 | 3,000 0 |
| 106. | පුද්ගලික විදුලි බිල්පත් එකතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 | 1,250 0 | 3,000 0 |
| 107. | පිත්තල භාණ්ඩ විකිණීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 108. | පින්තූර රාමු කිරීම | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 109. | බිත්තර ව්‍යාපාරය | 500 0 | 750 0 | 950 0 | 1,000 0 | 3,000 0 |
| 110. | කන්ටේනර් වාහන කුලියට දීම | 500 0 | 650 0 | 750 0 | 950 0 | 3,000 0 |
| 111. | වේවැල් භාණ්ඩ විකිණීම | 500 0 | 650 0 | 750 0 | 950 0 | 3,000 0 |
| 112. | විශේෂ වෛද්‍ය සේවා මධ්‍යස්ථානය | 750 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 113. | කණ්නාඩි ව්‍යාපාරය | 700 0 | 800 0 | 900 0 | 1,000 0 | 3,000 0 |
| 114. | වාහන ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම | 950 0 | 1,200 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 115. | වතුර පොම්ප විකිණීම | 750 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 116. | පුද්ගලික සත්ව වෛද්‍ය මධ්‍යස්ථාන | 1,000 0 | 1,200 0 | 1,350 0 | 1,500 0 | 3,000 0 |
| 117. | වර්ණ මාලු හා කුරුල්ලන් විකිණීම | 750 0 | 1,250 0 | 1,350 0 | 1,500 0 | 3,000 0 |
| 118. | ලවුඩ්ස්පීකර් යන්ත්‍ර කුලියට දීම | 750 0 | 1,350 0 | 1,450 0 | 1,500 0 | 3,000 0 |
| 119. | මුදල් ණයට දෙන්නා හා උකස් භාණ්ඩ මිලදී ගන්නා | 750 0 | 1,000 0 | 1,250 0 | 1,500 0 | 5,000 0 |
| 120. | නොතාරිස් කාර්යාලය | 750 0 | 1,000 0 | 1,250 0 | 1,500 0 | 5,000 0 |
| 121. | දැන්වීම් නිවේදනයන් නිකුත් කිරීමේ නියෝජිත මධ්‍යස්ථාන | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 122. | වර්ණ ආලේප ගබඩා කිරීම හා අලෙවි කිරීම | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 123. | වාහනවල වටිනාකම අගය සනාථ කරන සහතික ලබා දෙන මධ්‍යස්ථාන | 1,000 0 | 1,250 0 | 1,500 0 | 1,750 0 | 3,000 0 |
| 124. | MDF භාණ්ඩ ගබඩා කිරීම හා අලෙවිය | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 125. | හම් භාණ්ඩ අලෙවිය | 750 0 | 1,000 0 | 1,500 0 | 2,500 0 | 3,000 0 |
| 126. | ජංගම ව්‍යාපාරය | 750 0 | 1,000 0 | 1,250 0 | 1,500 0 | 3,000 0 |
| 127. | එළවලු ව්‍යාපාරය | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 128. | මාලු හා ඉස්සන් ව්‍යාපාරය | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 129. | කරවල අලෙවිය | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 130. | කුකුල් මස් අලෙවිය | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 131. | ආසන වෙන් කිරීමේ මධ්‍යස්ථාන පැවැත්වීම | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 132. | රීලෝඩ් කාඩ්පත් විකිණීම | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 133. | රියදුරු පුහුණු පාසල් පැවැත්වීම | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 134. | මහන යන්ත්‍ර අමතර කොටස් විකිණීම | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 135. | සත්ව ආහාර විකණීම | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 136. | කුකුල් පැටවුන් විකිණීම | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 137. | වෛද්‍ය පර්යේෂණාගාර පැවැත්වීම | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 138. | පැණි රස කැවිලි අලෙවිය | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 139. | තොග ගබඩා | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 140. | දේපල ව්‍යාපාරය | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 141. | ප්‍රදර්ශණාගාර | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 142. | ගස් සිටුවීම | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 143. | කොන්ත්‍රාත්කරුවන් | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 144. | සිහිවටන ලාංඡන කැපීම | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 145. | වාහන කුලියට දීම | 1,000 0 | 1,250 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |

07-797/1

F3-B80751

**කාත්තාන්කුඩිය නගර සභාව**

නගර සභා නීතියේ (255 වැනි පරිච්ඡේදයේ) දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම

2012.11.29 වැනි දින තීරණ අංක 2012/101 ට අනුව 2013.01.01 වැනි දින සිට පහත සඳහන් පරිදි ගාස්තු අයකර ගැනීමට තීරණය කර ඇති බව මෙයින් දන්වා සිටිමි.

නගර සභා නීතියේ 153 වැනි හා 167 වැනි ඡේදයන් යටතේ කාත්තන්කුඩිය නගර සභාව විසින් සකස් කරන ලද එම නීතියේ 154 වැනි ඡේදයේ පවරන ලද බලතලවලට අනුව දැන්වීම් සම්බන්ධයෙන් කාලීන නීතිය යටතේ 2013 පහත සඳහන් වගුවේ සඳහන් ගාස්තු අයකර ගැනීමට තීරණය කර ඇති බව මෙයින් දන්වා සිටිමි.

එස්. එච්. මුහම්මදු අස්පර්,
සභාපති,
නගර සභාව,
කාත්තන්කුඩිය.

වගුව

| | | රු. ශ. |
|---|---|---|
| 1. | සති 01-02 දක්වා දැන්වීම් සඳහා හතරැස් අඩියකට | 40 0 |
| 2. | සති 02 සිට මාස 01ක් දක්වා දැන්වීම් සඳහා හතරැස් අඩියකට | 50 0 |
| 3. | එස් මසකට අධික වසරක් දක්වා තාවකාලික දැන්වීම් සඳහා හතරැස් අඩියකට | 100 0 |
| 4. | වර්ෂයක කාලයක් සඳහා ස්ථිර දැන්වීම් සඳහා එක් හතරැස් අඩියකට | 100 0 |

07-797/5

---

**බලපිටිය ප්‍රාදේශීය සභාව**

බලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ යෝජිත නාමය යටතේ නම් කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මත කරන ලදුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වැනි වගන්තිය ප්‍රකාරව ගරු පළාත් පාලන අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව එම මාර්ගය මින් ඉදිරියට යෝජිත නාමයෙන් හැඳින්වීමට කටයුතු කරන බැව් මින් නිවේදනය කරමි.

උපලේඛනය

| | *විස්තරය* | *යෝජිත නාමය* |
|---|---|---|
| 01. | අංක 89 ග්‍රාම නිලධාරි වසමේ ගරුමුණි වලව්ව ආරම්භයේ සිට පළමුව හමුවන දකුණු පැත්තේ මාර්ගය | ගම්මඩු පත්තිනි දේවාල පාර |

ඒ. දයාරත්න ද සිල්වා,
සභාපති,
බලපිටිය ප්‍රාදේශීය සභාව.

2013 ජූලි මස 09 වැනි දින දී ය.
07-826

---

**කාත්තාන්කුඩිය නගර සභාව**

2013 වර්ෂය සඳහා සේවා බදු අය කිරීම

කාත්තාන්කුඩිය නගර සභාව විසින් 2012 වර්ෂයේ නොවැම්බර් මස 29 වැනි දින පැවැත්වූ පොදු සභා සැසි වාරයේ දී කරන ලද තීරණ අංක 2012/100 යටතේ පහත සඳහන් යෝජනා සභාවේ ස්ථිර කරන ලද බවට මහ ජනතාව මෙමගින් දන්වා සිටිනු ලැබේ.

කාත්තාන්කුඩිය නගර සභාවේ පළමු වන වට්ටාරම සිට 12 වන වට්ටාරම දක්වා ඇති සියලුම නොසෙල්වෙන වස්තූන් සඳහා වාර්ෂික වටිනාකමින් 2013 වර්ෂය සඳහා සම්පූර්ණ බද්ද 2013 ජනවාරි මස 31 වැනි දිනට ප්‍රථම නගර සභාව කාර්යාලය වෙත ගෙවීම් කළහොත් එම මුලු බද්ද සඳහා 10%ක

අඩු කිරීමක් ද සෑම වාරිකයක් සඳහා වූ බදු එම කාලය ඇතුලත මුල් මාසයේ අවසන් දිනයට ප්‍රථම නගර සභාව කාර්යාලය වෙත ගෙවීම කළහොත් 05% ක අඩු කිරීමක් ද ලබා දෙනු ලැබේ.

එස්. එච්. මුහම්මදු අස්පර්,
සභාපති,
නගර සභාව,
කාත්තාන්කුඩිය.

**යෝජනා**

"255 වැනි පරිච්ඡේදය වන නගර සභා ආඥා පනතේ 166 වැනි ඡේදය සමග කියවිය යුතු 252 වැනි පරිච්ඡේදය මහනගර සභා ආඥා පනත 238 වන ඡේදයේ (1) වන අභ්‍යන්තර කොටසේ නගර සභාවට ප්‍රදානය කරන ලද මතයන් ගේ ප්‍රයෝජනය උපයෝගී කරගෙන කාත්තාන්කුඩිය නගර සභාවේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සියලුම නිවාස ගොඩනැගිලි ඉඩම් හා ඉදිකිරීම් 2012 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2013 වර්ෂයේ වටිනාකම ලෙස පිලිගැනීමටත් අදාල නගර සභා ආඥා පනත 160 වන ඡේදයෙන් ප්‍රදානය කරන ලද මතයන් ගේ ප්‍රයෝජනය උපයෝගී කරගෙන ඉහත සඳහන් වාර්ෂික වටිනාකමින්,

*(අ)* පදිංචි ස්ථානයට සියයට 12% ක නිවාස බද්දක්ද,
*(ආ)* වෙළඳ හෝ ව්‍යාපාර කටයුතු සඳහා උපයෝගී කර ගන්නා ස්ථානයන්ට සියයට 15% ක බද්දක් ද,

2013 වර්ෂය සඳහා බදු පනවා අය කර ගැනීමටද එම බදු අදාල නගර සභා ආඥා පනත 170 වැනි ඡේදය සමග කියවිය යුතු නගර සභා ආඥා පනතේ 230 වැනි ඡේදයේ (2) වන අභ්‍යන්තර කොටසේ (ඉ) කොටසේ සැලසුම් යටතේ අදාල වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනි දිනයෙන් සම්පූර්ණ වන කාලවකවානුවන් හතරටම සමව කල්දීමෙන් මුදල් ගෙවීමට ආඥා කිරීමට කාත්තාන්කුඩිය නගර සභාව යෝජනා කර ඇත"

07-797/3

---

**කාත්තාන්කුඩිය නගර සභාව**

2013- වර්ෂය සඳහා තීරු බදු පැනවීම

කාත්තාන්කුඩිය නගර සභාව විසින් 2012 වර්ෂය සඳහා නොවැම්බර් මස 26 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 2012/101 යටතේ පහත සඳහන් යෝජනාවන් සභාවේ ස්ථිර කර ඇති බව මහජනතාවට මෙමගින් දන්වා සිටිනු ලැබේ.

ඊට එකඟව කාත්තාන්කුඩිය නගර සභා බල ප්‍රදේශය තුළ මෙම බදුවලට යටත්වන කිසියම් හෝ වාහනයක් හෝ සත්ත්වයෙක් හෝ ලඟ තබා ගන්නා සෑම කෙනෙකුම තමා ලඟ තබා ගන්නා ලද කාලය දින 30 ක් සම්පූර්ණ වූ විගස 2013 වර්ෂය සඳහා මෙම බද්ද කාත්තාන්කුඩිය නගර සභාව වෙත ගෙවිය යුතු බව දන්වා සිටිනු ලැබේ.

එස්. එච්. මුහම්මදු අස්පර්,
සභාපති,
නගර සභාව,
කාත්තාන්කුඩිය.

**යෝජනාව**

"255 වැනි පරිච්ඡේදය වන නගර සභා ආඥා පනතේ 162 වන ඡේදය සමග කියවිය යුතු එම ආඥා පනතේ 163 වන ඡේදය හා 3 වන වගුවේ සැලසුම් මගින් නගර සභාව වෙත ප්‍රදානය කරන ලද මතයන්ට අනුව කාත්තාන්කුඩිය නගර සභා බල ප්‍රදේශය තුළ 2013 වර්ෂය සඳහා පහත පෙන්වා ඇති වගුවේ වැඩසටහන් 1 කේ පෙන්වා ඇති කුමක් හෝ වාහනයක් හෝ සතෙකු තමා ලඟ තබාගෙන සිටින කෙනෙකුට එම II වන කොටසේ පෙන්වා දී ඇති ආකාරයට 2013 වර්ෂය සඳහා බදු පනවා අයකර ගනු ලැබීමට යෝජනා කරනු ඇත"

*වගුව*

| | | කොටස 1 | කොටස II<br>*රු. ශත* |
|---|---|---|---|
| (1) | (i) | මෝටර් වාහන ත්‍රිරෝද රථ, මෝටර් ලොරි, මෝටර් සයිකල්,අත්කරත්ත, ගොන් කරත්ත, රික්ෂෝ පාපැදි හා ට්‍රයිසිකල් නොවන සෑම වාහනයක් සඳහාම | 25 0 |
| | (ii) | සෑම සයිකලයක්ම හෝ ට්‍රයිසිකල් හෝ සයිකල් කාර් රථ හෝ සයිකල් රථ හෝ ට්‍රයිසිකල් කාර් හෝ ට්‍රයිසිකල් රථයන්ට | |
| | | *(අ)* ඒවා වෙළඳ කටයුතු සඳහා භාවිතා කරන්නේ නම් | 10 0 |
| | | *(ආ)* ඒවා වෙළඳ කටයුතු නොවන කටයුතු සඳහා භාවිතා කරන්නේ නම් | 5 0 |

| | | රු. ශත |
|---|---|---|
| (iii) | සෑම ගොන් කරත්තයක් සඳහාම | 20 0 |
| (iv) | සෑම අත් කරත්තයක් සඳහාම | 10 0 |
| (v) | සෑම රික්ෂෝ රථයක් සඳහාම | 7 50 |
| (vii) | සෑම අශ්ව පෝනියන්ට | 15 0 |
| (vii) | සෑම අලියන්ටම (ඇතුන්ට) | 50 0 |

(2) රෝදයේ පළල අඟල් 26 ට අධික නොවන ළදරුවන්ගේ වාහන විල්පරෝ පුද්ගලික ස්ථානයන්ට හෝ වෙළඳ සේවාවන් සඳහා භාවිත කරන අත් වාහන (රථ) මෙම දීමනාවලින් නිදහස් කරනු ලැබේ.

07-797/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.